Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

**8 ශ්‍රේණිය** පළමු වාර පරීක්ෂණය - 2019 **11 S**

**බුද්ධ ධර්මය - I කොටස** **කාලය පැය දෙකයි**

නම ................................................

**උපදෙස් :**
- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

★ **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) දේවදත්ත තෙරුන් සිදුකළ ආනන්තරිය පාපකර්මයක් වන්නේ,
i. මව මැරීමයි. ii. පියා මැරීමයි.
iii. සංඝ භේදයයි. iv. රහතන් වහන්සේලා මැරීමයි.

(02) බුද්ධත්වය ලබන විට බෝසතාණන් වහන්සේගේ වයස අවුරුදු
i. 80 කි. ii. 29 කි.
iii. 45 කි. iv. 35 කි.

(03) කිඹුල්වත් නුවර බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ඉදිකොට තිබූ ආරාමය කුමක්ද?
i. නිග්‍රෝධාරාමය. ii. ජේතවනාරාමය.
iii. වේළුවනාරාමය. iv. පූර්වාරාමය.

(04) බුදුරජාණන් වහන්සේ තුළ පැවති විවෘත කථා බහ ඇති බව හඳුන්වනු ලබන්නේ,
i. සබිල බව යනුවෙන් ය.
ii. සම්මෝදක බව යනුවෙන් ය.
iii. පුබ්බභාසී යනුවෙන් ය.
iv. උත්තානමුඛ යනුවෙන් ය.

(05) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු මුල් වරට කිඹුල්වත් නුවරට වැඩම කළේ,
i. වසරකට පසුව ය. ii. වසර දෙකකට පසුව ය.
iii. වසර තුනකට පසුව ය. iv. වසර හතරකට පසුව ය.

★ **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශය හරිනම් (✓) ලකුණද වැරදිනම් (X) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

(06) මසකට දෙවරක් මෙහෙණිය භික්ෂූන් වහන්සේලාගෙන් උපදෙස් ලබාගත යුතුය. ( )

(07) ජීවිතයේ සියලු වැදගත් අවස්ථාවල දී තෙරුවන් මුල්කර ගැනීම බෞද්ධයන්ගේ චාරිත්‍රයකි. ( )

(08) මට්ටකුණ්ඩලී කථාවෙන් බුදුරජාණන් වහන්සේගේ පුරිස ධම්ම සාරථී ගුණය පැහැදිලි වේ. ( )

(09) සැරියුත් තෙරණුවෝ රහත් බව ලැබුවේ වේදනා පරිග්ගහ සූත්‍ර දේශනාව ඇසීමෙන් ය. ( )

(10) මිනිස් ලොව පමණක් නොව දෙව් ලොව ද නිරයේද සැරිසරමින් සත්වයන් සිදු කළ, පින් පව් හා විපාක ජනතාවට දේශනා කළේ මුගලන් මහරහතන් වහන්සේ ය. ( )

★ **අංක 11 සිට 15 දක්වා ඇති වාක්‍ය වල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(මුගලන්, ආනන්ද, අස්සජි, අනේපිඬු, සම්මුඤ්ජනී)

(11) නන්දෝපනන්ද නාගරාජයා දමනය කළේ ________________ මහරහතන් වහන්සේ ය.

(12) "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාවෙන් ධර්ම දේශනා කළේ___________________මහරහතන් වහන්සේ ය.

(13) දේවදත්ත කුමාරයා සමග _____________________ කුමාරයා ද පැවිදි විය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(14) සැවැත්නුවර ජේතවනාරාමය බුදුරජාණන් වහන්සේට පූජා කළේ ______________________ සිටුතුමාය.

(15) නොපමාව ක්‍රියාකර සසර දිනූ හිමිනමක් ලෙස ______________________ හිමියන් හැඳින්විය හැකිය.

★ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවේ තිබෙන වරහනෙහි යොදන්න.**

| A | | B |
|---|---|---|
| (16) මුගලන් තෙරුන්ගේ ගිහි කළ නම වූයේ | ( ) | 1. සකුළුදායී පිරිවැජියා ය. |
| (17) බුදුරජාණන් වහන්සේගේ කථා බහ විශේෂයෙන් අගය කළ පුද්ගලයෙකු වූයේ | ( ) | 2. පොක්ඛරසාති බමුණු පඬිවරයා ය. |
| (18) බුදුරජාණන් වහන්සේ වේදනා පරිග්ගහ සූත්‍රය දේශනා කළේ | ( ) | 3. දීඝනඛ පිරිවැජියාට ය. |
| (19) ඡත්ත මානවකයාගේ ආචාර්ය වරයා වූයේ | ( ) | 4. සෝණදණ්ඩ බමුණා ය. |
| (20) බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාව ඇසීමට ඉතා කැමති වූ අන්‍යාගමික ගුරුවරයකු වූයේ | ( ) | 5. කෝලිත යන්න ය. |

## II කොටස

(01) **කෙටි පිළිතුරු සපයන්න.**

i. දෙව්දත් තෙරුන් විසින් බුදුරදුන් මැරවීමට යෙදූ උපක්‍රම වලින් දෙකක් ලියන්න.
ii. ශාක්‍ය වංශයේ හා කෝලිය වංශයේ පිරිසක් යුධ වදින්නට සූදානම් වූයේ කුමක් සඳහාද?
iii. "බොරු කීම කැතම ය
ගැරඬි කුණටත් නොසම ය" යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
iv. තුනුරුවන් වලින් දෙකක් නම් කරන්න.
v. ධර්ම රත්නයේ ගුණ 06 න් 02 ක් නම් කරන්න.
vi. අවමංගල උත්සවයකදී භික්ෂූන් වහන්සේලා විසින් "අනිච්චාවත සංඛාරා" යන ගාථාව සජ්ඣායනා කරනු ලබන්නේ කුමන අවස්ථාවේදී ද?
vii. මට්ටකුණ්ඩලී දෙව්ලොව උපත ලැබුවේ කුමන හේතුවක් නිසාද?
viii. රජගහ නුවර වාර්ෂිකව පැවැත්වූ මහා සැණකෙළිය හැඳින්වූ නම කුමක්ද?
ix. බුදුරදුන් දවස සෘද්ධිමතුන් අතර අග්‍රතනතුරට පත්වූයේ කවුරුන්ද?
x. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය ලෙස හඳුන්වනු ලබන්නේ කුමක්ද? එහි ඇතුළත් ගාථා ගණන කොපමණද?

(ලකුණු 10x2 = 20යි)

(02) i. බුද්ධානුස්සති භාවනාව යනු කුමක්ද?
(ලකුණු 02යි)
ii. බුදුගුණ වලින් තුනක් නම් කරන්න.
(ලකුණු 03යි)
iii. ඔබ බුදුගුණ වැඩිය යුත්තේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 05යි)

(03) i. අගසව් දෙනම නම් කරන්න.
(ලකුණු 02යි)
ii. අගසව් දෙනමගෙන් ගතහැකි ආදර්ශ තුනක් නම් කරන්න.
(ලකුණු 03යි)
iii. ඔබගේ ජීවිතය පවත්වාගෙන යාමේදී කල්‍යාණ මිතුරෙකු ඇසුරු කළ යුත්තේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 05යි)

(04) i. "යෝච පුබ්බේ පමජ්ජිත්වා" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ලකුණු 02යි)
ii. එහි අදහස ලියන්න.
(ලකුණු 03යි)
iii. ඔබ විසින් මෙලොව ජීවිතය මෙන්ම පරලොව ජීවිතය සඳහාද කුසල් රැස්කර ගත යුතු ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 05යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(05) i. දෙව්දත් කුමරු පැවිදි වූයේ කොහේදීද?

(ලකුණු 02යි)

ii. දෙව්දත් තෙරුන් බුදුරදුන්ගෙන් ඉල්ලූ වර පහෙන් තුනක් ලියන්න.

(ලකුණු 03යි)

iii. වෛර කිරීමෙන් කිසිවකුට යහපතක් සිදුනොවේ. මේ බව දෙව්දත් තෙරුන්ගේ චරිතය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 03යි)

(06) i. සිරිත් හා විරිත් යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 02යි)

ii. ඔබගේ උපන් දිනය වෙනුවෙන් බෞද්ධ දරුවෙකු වශයෙන් ඔබට කළ හැකි දේවල් වලින් තුනක් ලියන්න.

(ලකුණු 03යි)

iii. ඔබගේ ගමේ පන්සලේ හෝ වෙනත් පන්සලක වැඩ වාසය කරන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට ඔබ පුදසත්කාර කළ යුත්තේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(07) පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය
ii. ආගන්තුක සත්කාරය
iii. චුල්ලපන්ථක හිමියන්
iv. ධර්ම රත්නය

(ලකුණු 05x2 = 10යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පළමු වාර පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය බුද්ධ ධර්මය (පිළිතුරු පත්‍රය)

### I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | iii | 6. | √ | 11. | මුගලන් |
| 2. | iv | 7. | √ | 12. | අස්සජි |
| 3. | i | 8. | X | 13. | ආනන්ද |
| 4. | iv | 9. | √ | 14. | අනේපිඬු |
| 5. | i | 10. | √ | 15. | සම්මුඤ්ජනී |

16. - v
17. - iv
18. - iii
19. - ii
20. - i

(ලකුණු 2 x 20 = 40යි)

### II කොටස

(01) i. නාලාගිරි ඇතුට රා පොවා මහ මගට යැවීම, දුනුවායන් යොදා ඊතල වලින් විදීමට සැලැස්වීම, ගිජ්ඣකූට පර්වතයට නැගී ගලක් පෙරලීම.
ii. රෝහිණී නදියේ ජලය බෙදා ගැනීම සඳහා
iii. ඇත්ත නම් කදිම ය
මෙලොව රජ සැපටත් උතුම ය
iv. බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය
v. ස්වාක්ඛාත, සන්දිට්ඨික, අකාලික, ඒහිපස්සික, ඕපනයික, පච්චත්තං, වේදිතබ්බෝ විඤ්ඤූහි
vi. මතක වස්ත්‍රය පූජා කරන අවස්ථාවේ දී
vii. මරණාසන්න මොහොතේදී තමා ඉදිරියේ දර්ශනය වූ බුදුරුව වන්දනය කළ පින් මහිමය නිසා.
viii. ගිරග්ගසමජ්ජ
ix. මුගලන් මහරහතන් වහන්සේ
x. ධම්ම පදය, 423යි (ලකුණු 10 x 2 = 20යි)

(02) i. බුදුගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව (ලකුණු 2 යි)
ii. අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තර පුරිසධම්මසාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධ, භගවා (ලකුණු 3 යි)
iii. ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5 යි)

(03) i. සැරියුත් මහ රහතන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ (ලකුණු 2 යි)
ii. ගුරු ගෞරවය, කල්‍යාණමිත්‍ර ආශ්‍රය, නිහතමානී බව, පරාර්ථ සේවය යනාදී වශයෙන් ප්‍රශ්නයට අදාළව ලියා ඇති කරුණු 03කට ලකුණු ලබාදෙන්න. (ලකුණු 3 යි)
iii. ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5 යි)

(04) i. යෝච පුබ්බෙ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජති (ලකුණු 2 යි)
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්බා මුත්තෝව චන්දිමා
ii. යම් කෙනෙක් මුලදී පමා වුවත් පසුව නුවණින් විමසා බලා නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වළාගැබින් මිදුණු පුන්සඳ මෙන් මේ මුළු ලෝකයම බබළවයි. (ලකුණු 3 යි)
iii. ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5 යි)

(05) i. මල්ල රට අනුපිය නම් අඹ වනයේ දී
ii. ⋆ භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම ආරණ්‍යකව විසියි යුතුය. (ලකුණු 2 යි)
⋆ භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පිණ්ඩපාතයෙන් යැපිය යුතුය.
⋆ භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පාංශුකූලික විය යුතුයි.
⋆ භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම වෘක්ෂ මූලිකව විසිය යුතුය.
⋆ භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම මස් මාංස වැළඳීමෙන් වැළකී විසිය යුතුය. (ලකුණු 3 යි)
iii. ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5 යි)

(06) i. සිරිත් - කළයුතු දේ (චාරිත්‍ර)
විරිත් - නොකළ යුතු දේ (වාරිත්‍ර) (ලකුණු 2 යි)
ii. බෝධි පූජාවක් පැවැත්වීම, පැළයක් රෝපණය කිරීම, පන්සල් යෑම යනාදී වශයෙන් ලියා ඇති කරුණු තුනකට ලකුණු ලබාදෙන්න. (ලකුණු 3 යි)
iii. ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5 යි)

(07) පෙළ පොතේ 3,4/ 12,13/5,6/18,19,20 පිටු බලන්න. (ලකුණු 2 යි)